# FOREIGN FINANCE
# (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# විනිමය අනුපාතික ක්‍රම

ප්‍රධාන වශයෙන් විනිමය අනුපාත ක්‍රම දෙකක් පිළිබඳ ව සාකච්ඡා කෙරේ. එනම්,

- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය
- නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය

# ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය

මූල්‍ය අධිකාරිය විසින් තීරණය කළ විනිමය අනුපාතිකය නැවත මූල්‍ය අධිකාරිය විසින් ම වෙනස් කරන තෙක් ම එක ම මට්ටමක පවතින්නේ නම් එය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය ලෙස හඳුන්වයි.

ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයට පදනම් වූයේ රන් මිනුම් ක්‍රමය හා රන් හුවමාරු ක්‍රමය යි. එනම් රන් සංචිත ක්‍රමය මත ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පදනම වේ.

ඇමරිකා එක්සත් ජනපදය රන් අවුන්සයක් පෙඩරල් සංචිත බැංකුවේ තැන්පත් කළ විට ඩොලර් 35ක් නිකුත් කරන ලදි.

ClassWork.LK

එංගලන්තයේ මහ බැංකුවේ රන් අවුන්සයක් තැන්පත් කළ විට ස්ටර්ලින් පවුම් 12.50ක් නිකුත් කරන ලදි. ඒ අනුව ඩොලර් හා පවුම් අතර විනිමය අනුපාතිකය £1 = $ 2.80 විය.

එය රන් අවුන්සයකට නිකුත් කරන ඩොලර් ප්‍රමාණය හෝ ස්ටර්ලින් පවුම් ප්‍රමාණය වෙනස් වන තෙක් ම ස්ථාවර ව තිබිණි.

ClassWork.LK

# ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක වාසි

ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය රටකට වාසිදායක ලෙස බලපාන්නේ පහත පරිද්දෙන් ය.

- විනිමය අනුපාතිකය ස්ථාවර නිසා ආනයනකරුවන්ට ඇති වන අවදානම අඩු ය.

- විනිමය අනුපාතිකය ස්ථාවර නිසා විදේශ ආයෝජකයන්ට විදේශ ණය සැපයුම් කරුවන්ට ඇති වන අවිනිශ්චිත බව අඩු ය.

- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින විට සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයන් කළමනාකරණය කිරීමේ කිරීමේ හැකියාව වැඩි ය.

- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින විට සමපේක්ෂණ චේතනාවෙන් විදේශ ව්‍යවහාර මුදල් ඉල්ලුම් කිරීමට නොපෙළඹෙන නිසා විදේශ විනිමය හිඟයක් ඇති නොවේ.

- විනිමය අනුපාතිකයේ වෙනස් වීම මගින් අපනයන කරුවන්ට වාසි ලබා ගත නොහැකි බැවින් අපනයනවල තරගකාරීත්වය ඉහළ නංවා ගැනීම අපනයන කරුවන් පෙළඹෙයි.

ClassWork.LK

# ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක අවාසි

- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය රටකට අවාසිදායක ලෙස බලපාන්නේ පහත පරිද්දෙන් ය.

- බාහිර සමතුලිතතාව (ගෙවුම් තුලනයේ සමබරතාව) පවත්වා ගැනීමට, අභ්‍යන්තර සමතුලිතතාව (සමාහාර ඉල්ලුම හා සමාහාර සැපයුම තුලිත ව පවත්වා ගැනීම) කැප කිරමට සිදු වීම.

- ගෙවුම් ශේෂ හිඟයක් ඇති වුවහොත් එය සමනය කර ගැනීමට අභ්‍යන්තර ආර්ථිකයේ අවධානයක් ඇති කර ගැනීමට සිදු වීම.

- ස්ථාවර විනිමය අනුපාතිකයේ අධි තක්සේරුවක් හෝ ඌන තක්සේරුවක් පැවතුණහොත් එය නිරතුරු ව ගෙවුම් ශේෂ හිඟයක් හෝ අතිරික්තයක් හෝ ඇති වීමට හේතු වේ.

ClassWork.LK

- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන විට එහි අධි තක්සේරු වීම් යටතේ මතු වන විදේශ විනිමය හිඟයක් පියවීමට මූල්‍ය අධිකාරියට විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගෙන යාමට සිදු වීම.
- එය විශාල මූල්‍ය ප්‍රමාණයක් අකර්මණ්‍ය ලෙස සිර කර තැබීමකි.

- විදේශ විනිමය සංචිත අවසාන වන විට විනිමය හිඟය පියවා ගැනීමට විකල්ප ක්‍රියා මාර්ග ලෙස ආනයන පාලනය වැනි ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට සිදු වීමෙන් විවෘත වෙළෙඳාමෙන් ලැබිය හැකි ශුභ සාධනය අඩු වේ.

Class Work.LK

# නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය

විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම මත තීරණය වන විනිමය අනුපාතිකය නම්‍ය විනිමය අනුපාතිකය, (චල විනිමය අනුපාතිකය, පාවෙන විනිමය අනුපාතිකය) ලෙස හඳුන්වයි.

එය ඉල්ලුම හා සැපයුම බලවේගවල වෙනස් වීම මත නිරන්තරයෙන් වෙනස් වේ.

1970න් පසු ලෝකයේ බොහෝ රටවල නම්‍ය විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක විය.

විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම ඉහළ යන විට විදේශ විනිමය අනුපාතිකය වැඩි වන අතර විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම පහළ යන විට විදේශ විනිමය අනුපාතිකය පහළ යයි.

විනිමය අනුපාතිකය ඉහළ යාම නිසා දේශීය මුදලේ විදේශ අගය පහළ යාම **මුදලේ විදේශ අගය ක්ෂය වීම** ලෙස හඳුන්වයි.

ClassWork.LK


නම්‍ය විනිමය අනුපාතිකයේ චලනයන්ට බලපාන්නේ රටක් තුළට ගලා එන හා රටින් පිටතට ගලා යන විදේශ විනිමය ප්‍රවාහයන් ය.

එනම් ගෙවුම් ශේෂ ලේඛනයේ ලැබීම් හා ගෙවීම් පාර්ශ්වයන්ගේ ගනුදෙනු විනිමය අනුපාතිකයේ වෙනස් වීමට බලපානු ඇත.

ගෙවුම් ශේෂ ලේඛනයේ අපනයන ශීඝ්‍රයෙන් වර්ධනය වන විට නම්‍ය විනිමය අනුපාතිකය පහළට ගමන් කරයි. මුදලේ විදේශ අගය ඉහළ යයි.


මෙය පහත රූප සටහනෙන් පෙන්නුම් කෙරේ.

විදේශ විනිමය අනුපාතිකය $\frac{\$}{Rs}$




ClassWork.LK

ගෙවුම් ශේෂ ලේඛනයේ ආනයන ශීඝ්‍රයෙන් වර්ධනය වූ විට නම්‍ය විනිමය අනුපාතිකය ඉහළට ගමන් කරයි. මුදලේ විදේශ අගය පහළ යයි.




නම්‍ය විනිමය අනුපාතිකය මගින් ගෙවුම් ශේෂය ස්වයංක්‍රිය ව තුලනය වන යාන්ත්‍රණයක් නිර්මාණය වේ.

ගෙවුම් ශේෂ ලේඛනයේ හිඟයක් පවතින විට විදේශ විනිමය සඳහා ඉල්ලුම වැඩි වීම හා සැපයුම අඩු වීම මගින් විනිමය අනුපාතිකය ඉහළ යන්නට පටන් ගනී.

ClassWork.LK

එවිට මුදලේ විදේශීය අගය පහළ ගොස් අපනයන වර්ධනය වේ. ආනයන අධෛර්යවත් වේ.

ගෙවුම් ශේෂ ලේඛනයේ අතිරික්තයක් පවතින විට විදේශ විනිමය සඳහා සැපයුම වැඩි වේ. ඉල්ලුම අඩු වේ.

එවිට විනිමය අනුපාතිකය පහළ යන්නට පටන් ගනී. මුදලේ විදේශ අගය ඉහළ යයි. එවිට ආනයන වැඩි වේ. අපනයන අඩු වේ. ගෙවුම් තුලන සමබරතාව ඇති වේ.

ClassWork.LK

## නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයේ වාසි

- නම්‍ය විනිමය අනුපාතිකය විදේශ විනිමය ඉල්ලුම සහ සැපයුම සමාන කෙරෙන සමතුලිත විනිමය අනුපාතිකයක් බැවින් විනිමය අනුපාතිකය අධි තක්සේරු වීමටත් ඌන තක්සේරු වීමටත් ඉඩක් නොමැත.

- තාත්ත්වික විනිමය අනුපාතිකයක් පවත්නා බැවින් ගෝලීය ආර්ථික සම්පත් විකල්ප භාවිතයන් අතර වඩාත් කාර්යක්ෂම ආකාරයට බෙදී යයි.

- නම්‍ය විනිමය අනුපාත ක්‍රමය මගින් බාහිර සමතුලිතතාව නිරායාසයෙන් ගොඩ නැගෙන බැවින් ප්‍රතිපත්ති සම්පාදකයන් හට අභ්‍යන්තර සමතුලිතතාව උදෙසා තම පූර්ණ ප්‍රයත්නය යෙදවිය හැකි ය.

- මූල්‍ය ප්‍රතිපත්ති බාහිර සාධකවලින් බලපෑමෙන් සම්පූර්ණයෙන් ම නිදහස් නිසා දේශීය ආර්ථිකය ශක්තිමක් කිරීමට මූල්‍ය ප්‍රතිපත්ති නිදහසේ යොදා ගත හැකි ය.

ClassWork.LK

- විනිමය අනුපාත තීරණය වීමේ දී විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුම හා සැපයුම සමතුලිත වන නිසා විදේශ විනිමය හිඟයක් හෝ අතිරික්තයක් හෝ ඇති නොවේ.

- එම නිසා විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් මතු නොවේ.

- ආනයන හා අපනයන පාලනය සඳහා ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු නොවන බැවින් වඩාත් විවෘත වෙළෙඳාම මගින් සමාජ ශුභ සාධනය උපරිම වශයෙන් භුක්ති විඳීමට ඉඩ ප්‍රස්තාව හිමි වේ.

Class Work.LK

## නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයේ අවාසි

- විනිමය අනුපාතිකය නිරන්තරයෙන් උස් පහත් වීම නිසා ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනයට නම්‍ය විනිමය අනුපාතිකය බාධාවකි.

- නම්‍ය විනිමය අනුපාතිකය විදේශ ආයෝජකයන්ට හා ණය සැපයුම්කරුවන්ට දැඩි අවිනිශ්චිත බවක් ඇති කරයි.

- නම්‍ය විනිමය අනුපාතිකයක් පවත්නා විට විනිමය වෙළෙඳපොළ ආශ්‍රිත සමපේක්ෂණ ක්‍රියා බහුල වේ. එමගින් විනිමය අනුපාතිකයේ උච්චාවචනය තව තවත් තීව්‍ර කරයි.

- නිරන්තරයෙන් වෙනස් වන විනිමය අනුපාතිකයන් බැවින් සමස්ත ආර්ථිකයේ විනය පවත්වා ගැනීම දුෂ්කරයි.

- විනිමය අනුපාතිකයේ උච්චාවචනය මගින් අපනයන කරුවන්ට වාසි ලැබිය හැකි බැවින් අපනයන තරගකාරිත්වය වර්ධනය කර ගැනීමට දක්වන උනන්දුව අඩු වේ.

ClassWork.LK

# පාලිත නම්‍ය විනිමය අනුපාතිකය

පාලිත නම්‍ය විනිමය අනුපාතිකය, ස්ථාවර විනිමය අනුපාතිකයේත් නම්‍ය විනිමය අනුපාතිකයේත් සංකලනයකි.

ස්ථාවර විනිමය අනුපාතිකය සහ නම්‍ය විනිමය අනුපාතිකයේ වාසි අත්පත් කර ගැනීම සඳහා පාලිත නම්‍ය විනිමය අනුපාතිකය සකසා ඇත.

ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන අවස්ථාවක එය කිසියම් පරාසයක් තුළ වෙනස් වීමට ඉඩ දී ඇත.

එම පරාසය ඉක්මවා වෙනස් වන විට මූල්‍ය අධිකාරිය විදේශ විනිමය වෙළෙඳපොළට පිවිස විදේශ විනිමය / දේශීය මුදල් විකිණීම හෝ මිල දී ගැනීම මගින් විදේශ විනිමය අනුපාතිකයේ අන්තගාමී දෝලනය පාලනය කරනු ලබයි.

ClassWork.LK

එය පාලිත නම්‍ය විනිමය අනුපාතිකය හෙවත් කළමනාකරණය කළ නම්‍ය විනිමය අනුපාතය ලෙස හඳුන්වයි.

මෙසේ මූල්‍ය අධිකාරිය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වන්නේ කෙටි කාලීන වශයෙන් වුව ද එමඟින් විනිමය අනුපාතිකයේ කාලීන ස්ථාවරත්වයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

ClassWork.LK

## සඵල විනිමය අනුපාතිකය

කිසියම් රටක ව්‍යවහාර මුදල් ඒකකය සඳහා විදේශ විනිමය අනුපාතිකය, විවිධ විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂ ව විවිධ ප්‍රමාණයන්ගෙන් සහ විවිධ දිශාවන්ට වෙනස්වන විට එම වෙනස් වීම්වල මධ්‍යගත අගය ගණනය කිරීම සඳහා සඵල විනිමය අනුපාතිකය ගණනය කරයි.

**සඵල විනිමය අනුපාතිකයේ ස්වරූප දෙකක් ඇත.**

- නාමික සඵල විනිමය අනුපාතිකය
- මූර්ත සඵල විනිමය අනුපාතිකය

## නාමික සඵල විනිමය අනුපාතිකය

නාමික සඵල විනිමය අනුපාතිකය යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාව සමඟ විදේශ වෙළෙඳාමේ යෙදෙන ප්‍රධාන රටවල් 24හි නාමික විනිමය අනුපාතිකයන් මත, එම රටවල් අතර ඇති වන විදේශ වෙළෙඳාමේ ප්‍රමාණය මත බර තබා ගණනය කළ හැකි භරිත සාමාන්‍ය විනිමය අනුපාතිකයයි.

Classwork.LK

# මූර්ත සඵල විනිමය අනුපාතිකය

මූර්ත සඵල විනිමය අනුපාතිකය යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය සහ විදේශ වෙළෙඳාමේ යෙදෙන රටවල උද්ධමන අනුපාතිකයන් අතර වෙනසේ සාමාන්‍ය, නාමික සඵල විනිමය අනුපාතිකයට ගළපා සකස් කරනු ලබන විනිමය අනුපාතිකය වේ.

නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අතර සම්බන්ධය සරල නිදසුනක් මගින් පහත පරිදි විග්‍රහ කළ හැකි ය.

| වෙළෙඳ හවුල්කරුවන් | නාමික විනිමය අනුපාතිකය (R) | විදේශ වෙළෙඳාම මත බර තැබීම (W) | R×W | ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය | විදේශ උද්ධමන අනුපාතිකය | වෙනස |
|---|---|---|---|---|---|---|
| 1. ඇමරිකා එක්සත් ජනපදය | 1 $ = රු. 150 | 30 | 4500 | 8 | 10 | -2 |
| 2. එක්සත් රාජධානිය | 1 $ = රු.200 | 20 | 4000 | 8 | 12 | -4 |
| 3. ඉන්දියාව | 1 Rs = රු.1.42 | 35 | 50 | 8 | 5 | +3 |
| 4. චීනය | 1 U = රු.2 | 10 | 20 | 8 | 10 | -2 |
| 5. ජපානය | 1 F = රු. 2 | 5 | 10 | 8 | 5 | +3 |
| | | $\Sigma W = 100$ | 8580 $\Sigma RW$ | | | -8+6=-2 |

ClassWork.LK

නාමික සඵල විනිමය අනුපාතිකය $= \dfrac{E_{RW}}{E_W}$

$= \dfrac{8580}{100}$

$= \underline{\underline{85.80}}$

නාමික සඵල විනිමය අනුපාතිකය 85.80 යන්නෙන් අදහස් කරන්නේ ඉහත දැක් වූ ශ්‍රී ලංකාව සමග විදේශ වෙළෙඳාමෙහි යෙදෙන ඕනෑ ම රටක සාමාන්‍ය විනිමය අනුපාතිකය රු. 85.80 ක් වන බවයි.

ඉහත සඳහන් නාමික සඵල විනිමය අනුපාතිකයට එක් එක් රටවල උද්ධමන අනුපාතිකය හා ශ්‍රී ලංකාවේ උද්ධමනය අනුපාත වෙනසෙහි සාමාන්‍ය ගැළපූ විට මූර්ත සඵල විනිමය අනුපාතිකය ලැබේ.

මූර්ත සඵල විනිමය අනුපාතිකය = නාමික සඵල විනිමය අනුපාතිකය + දෙරටේ විනිමය අනුපාතිකය වෙස්වීමේ සාමාන්‍යය = 85.80 + (-2)

= 83.80

ClassWork.LK

ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකයට වඩා විදේශ වෙළෙඳාමේ යෙදෙන රටෙහි උද්ධමන අනුපාතිකය වැඩි නම් නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය අඩු අගයක් ගනී.

ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකයට සාපේක්ෂ ව විදේශ වෙළෙඳාමේ යෙදෙන රටවල උද්ධමන අනුපාතික අඩු නම් නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය ඉහළ අගයක් ගනී.

නාමික සඵල විනිමය අනුපාතිකයේ ස්වභාවය වනුයේ විවිධ රටවල නාමික විනිමය අනුපාතිකයන් නිරතුරු ව ම ඉහළ හා පහළ යාමයි.

එවිට රුපියලේ විදේශ අගය නිශ්චිත ව ප්‍රකාශ කළ නොහැකි වේ.

ඊට විසඳුමක් ලෙස විදේශ රටවල නාමික විනිමය අනුපාතිකයන්ගේ මධ්‍යයන අගයක් ලෙස සඵල විනිමය අනුපාතිකය අනුව දේශීය මුදලේ විදේශ අගය වඩාත් නිශ්චිත පදනමකින් ප්‍රකාශ කළ හැකි වේ.

මූර්ත සවුල විනිමය අනුපාතිකයේ ස්වභාවය වනුයේ අදාළ රටේ අපනයන තරඟකාරිත්වය මිනුම් කිරීමට දර්ශකයක් වශයෙන් යොදා ගැනීමට හැකි වීම යි.

මූර්ත සවුල විනිමය අනුපාතිකය ගණනය කරනුයේ නාමික සවුල විනිමය අනුපාතිකයට වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමනය අනුපාතිකයක් මෙරට උද්ධමන අනුපාතිකයත් අතර වෙනස ගැලපීම මගිනි.

නාමික සවුල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සවුල විනිමය අනුපාතිකය පහළ අගයක් ගැනීම මගින් අදහස් කරන්නේ මෙරටේ උද්ධමන අනුපාතිකය වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමන අනුපාතිකයට වඩා අඩු බව යි.

එයින් තහවුරු වන්නේ මෙරටේ අපනයන තරඟකාරීත්වය ඉහළ මට්ටමක පවතින බව යි.

ClassWork.LK

නාමික සචල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සචල විනිමය අනුපාතිකය ඉහළ අගයක් ගැනීම මගින් අදහස් කරන්නේ වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමන අනුපාතිකයට සාපේක්ෂ ව මේ රටේ උද්ධමන අනුපාතිකය වැඩි බව යි.

එයින් තහවුරු වන්නේ මේ රටේ අපනයන තරගකාරිත්වය පහළ මට්ටමක පවතින බව යි.

නාමික සචල විනිමය අනුපාතිකය මූර්ත සචල විනිමය අනුපාතිකය සමග සැසඳීම ඔස්සේ දේශීය නාමික විනිමය අනුපාතිකය අධි තක්සේරුවකින් යුක්ත ද ඌන තක්සේරුවකින් යුක්ත ද සම තක්සේරුවකින් යුක්ත ද යන්න මිනුම් කළ හැකි ය.

ClassWork.LK

# මූර්ත විනිමය අනුපාතිකය

මූර්ත විනිමය අනුපාතිකය යනු රටවල් දෙකක් අතර පවතින මිල මට්ටම්වල වෙනස්කම් ගලපන ලද නාමික විනිමය අනුපාතිකය යි.

එය ගණනය කරන ආකාරය පහත දැක්වේ.

$$RER = NER\ (Pd/Pf)$$

RER = මූර්ත විනිමය අනුපාතිකය

NER = නාමික විනිමය අනුපාතිකය
(රුපියලකින් මිල දී ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය)

Pd = දේශීය මිල මට්ටම්

Pf = විදේශීය රටේ මිල මට්ටම

ClassWork.LK

**නිදසුන :**

ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 1 = ශ්‍රී ලංකා රුපියල් 150

ශ්‍රී ලංකාවේ මිල මට්ටම = 110

ඇමෙරිකා එක්සත් ජනපද මිල මට්ටම = 220

මූර්ත විනිමය අනුපාතිකය $= \dfrac{1}{150} \times \dfrac{110}{220}$

$= \underline{\underline{0.0033}}$

ClassWork

## මූර්ත විනිමය අනුපාතිකය වෙනස් විය හැකි ආකාර

මූර්ත විනිමය අනුපාතිකය වෙනස් විය හැකි ආකාර දෙකක් ඇත.

- මූර්ත විනිමය අනුපාතිකය පහළ යාම
- මූර්ත විනිමය අනුපාතිකය ඉහළ යාම

## මූර්ත විනිමය අනුපාතිකය පහළ යාම

මූර්ත විනිමය අනුපාතිකය පහළයාම යනුවෙන් අදහස් කරන්නේ වර්ෂය මුල මූර්ත විනිමය අනුපාතිකයට සාපේක්ෂව වර්ෂය අවසානයේ මූර්ත විනිමය අනුපාතිකය පහළ අගයක් ගැනීම යි.

**නිදසුන :**

වර්ෂය මුල මූර්ත විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් 1 = $ 0.03 සිට වර්ෂය අවසානයේ මූර්ත විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් 1 = $ 0.01 දක්වා පහළ යාම.

ClassWork.LK

# <u>මූර්ත විනිමය අනුපාතිකය පහළ යන අවස්ථා</u>

මූර්ත විනිමය අනුපාතිකය පහළ යන අවස්ථා පහත දැක්වේ.

- දේශීය මිල මට්ටම හා විදේශීය මිල මට්ටම ස්ථාවරව තිබිය දී නාමික විනිමය අනුපාතිකය පහළ යාම

- නාමික විනිමය අනුපාතිකය සහ විදේශ රටේ මිල මට්ටම ස්ථාවරව තිබිය දී දේශීය මිල මට්ටම පහළ යාම

- නාමික විනිමය අනුපාතිකය සහ දේශීය මිල මට්ටම ස්ථාවර ව තිබිය දී විදේශ රටේ මිල මට්ටම ඉහළ යාම

ClassWork.LK

# මූර්ත විනිමය අනුපාතිකය පහළ යාමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක

- අපනයන තරගකාරිත්වය වැඩි වී අපනයන ධෛර්යමත් වේ.
- ආනයන අධෛර්යවත් වේ.
- වෙළෙඳ ගිණුමේ යහපත් ප්‍රවණතාවක් ඇති වේ.

ClassWork.LK

# ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය

සමතුලිත විනිමය අනුපාතිකයන් පිළිබඳ සාකච්ඡා කිරීමකදී ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය වඩාත් වැදගත් සංකල්පයක් වේ.

වෙළෙඳාමට පාත්‍ර වන රටවල් දෙකේ සමාන භාණ්ඩ පැසක වටිනාකම එම රටවල දේශීය මුදල් ඒකකවලින් මනිනු ලැබුවහොත් එම අගයන් දෙක අතර අනුපාතිකය ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය වේ.

**නිදසුන :**

සමාන වර්ගයේ භාණ්ඩ පැසක මිල = රු. 1000/-

එම භාණ්ඩ පැසෙහි විදේශීය රටෙහි මිල = $ 20

ක්‍රය ශක්ති සාම්‍ය $ 20 = රු. 1000/-

$$\$ 1 = \text{රු.} = \frac{1000}{20}$$

$$= \text{රු. } 50$$

ClassWork.LK

මෙයින් අදහස් කරන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ දී ඩොලරයේ ක්‍රය ශක්තිය ශ්‍රී ලංකාවේ රු. 50 ක ක්‍රය ශක්තියට සමාන බව යි.

නාමික විනිමය අනුපාතිකය හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය අතර යම් වෙනසක් පැවතුණ ද දිගු කාලයේ දී සමතුලිත විනිමය අනුපාතිකය ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය කරා නැඹුරු විය යුතු ය.

රටවල් දෙකක් අතර නාමික විනිමය අනුපාතිකය සහ ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය සමාන නම් ඉන් අදහස් වන්නේ දෙරටේ භාණ්ඩවල මිල ගණන් එකිනෙකට සමාන වන බව යි.

මේ නිසා එක් රටක් අභිබවා අනෙක් රටට තරගකාරිත්වයේ වාසි ලබා ගත නොහැකි ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura